## කවි කොළය

# ඔබමය යාවජීවී රජු සිහළ බිම

මහ වීරයා එල්ටීටී සින මාවේ
යටවී තැලී ගල්රෝලට හමු දාවේ
ගස් මැඩියෙකු වගෙයි මිහිමත පත බෑවේ
මහ ජය මඟුල මෙය වෙයි සිංහළ දූවේ

අපරාජිතය ඔහු ලොව රණ දෙරණ මත
රට රට ඩයස්පෝරාවෙන් දැමුව පොත
සුන්නද්දූලි වී නිරුවත මතුව ඇත
කොටි මවිලක් පවා අද බේතකට නැත

ඊළාමයට කපමින් මුල සිට පාර
තුරුළට රැගෙන නැළවූ කොටි අව තාර
ජයලලිතාට මහ ජන්දෙදි මේ පාර
ජනතාවගෙන් වැදුණා බූවලු පාර

ඉන්දිය රජය සිටියදි අන්තයට නොයා
ලේ ගඟ වැහෙන කොටියා උර මතෙහි තියා
රඟපෑමක යෙදුණු සිය වාසියම සොයා
වයිකෝ වගේ පුස්සන් බිංදුවට ගියා

ඊළාමයේ රජු වන්නට ඉහත දිනේ
මැව්වත් සිහින අවසානයෙ මොකද වුණේ
මහ කොටි සිරස බැලූවිට එහි පහළ කොණේ
මොළයක් නොවූ බව නම් පැහැදිලිව පෙනේ

සෙන්පතියෙකුට යළි කිසිදා කිසිම වර
නොතබමි මගෙන් පසු යුද්ධය ඉතුරු කර
හමුදාපති කෙනෙකු මේ වැනි දුටුව දුර
ලොව අන් තැනක සිටියෙද ලක්බිමෙහි හැර

හසලක වීරයාගේ සිට හමු දාවේ
පුද දුන් දූ පුතුන් රට වෙනුවෙන් ජීවේ
සමගින් සියළු සෙබළුන් ඉටු කළ සේවේ
දස මහ යෝධයෝ වෙති සිංහළ දූවේ

ගජබා ගැමුණු පැරකුම් කිතු විජය අබා
රජ පෙළපතෙහි විහිදන මිණි කිරණ පබා
හයවැනි මිහිඳු නම ජයටැඹ පෙරට තබා
ඉතිහාසයේ ලියැවෙන බව කියමි නොබා

ජනපතිතුමනි නොසැලෙන
මහමෙරට සම
කුමටද තවත් ජනපතිවරු
රටට මෙම
මාඕ - ටිටෝ - කැස්ට්‍රෝ මෙන්
නිබඳ වම
වනු මැන යාව ජීවී රජු
සිහළ බිම!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



## How the world revolves round criminals

**These are historical accidents: Adolf Hitler, Idi Amin, Saloth Sar alias Pol Pot Saddam Hussein, and Velupillai Prabhakaran. Undeserving positions they all attained by bluff**

**1. Adolf Hitler** - 1905 on, Hitler lived a bohemian life in Vienna on an orphan's pension and support from his mother. In the first world war he was a Bohemian Lance Corporal..

**2. Idi Amin** joined the King's African Rifles of the British Colonial Army in 1946 as an assistant cook.

**3. Pol Pot** won a scholar ship to France . As a result of failing his exams in three successive years, he was forced to return to Cambodia in January 1954.

**4. Saddam Hussein** was an uneducated Sheppard tribal boy from Tikrit.

**5.Velupillai Prabhakaran** at the very young age became a smuggler. in his native Velvettithurai in Sri Lanka's Jaffna peninsula

All are criminals taken nationalismto hide their crimes, luckily /accidentally successful until each of them killed millions and finally got killed. Nothing great or more about them, but sheer luck they were able to survive so long to put the world they associated to horrible human misery.

Talking about Prabhakaran, some Indians say, if Indo / Lanka accord was accepted, if moderates like Amrithalingam were not killed, Lankan Tamils would not have gone through all that misery and Sri Lanka government wouldn't have fought a long battle sadly with its own natives.

**Ekappan, Mattunga - New Delhi**



**Quite perplexed, Karuna Amman and Daya Master staring at the nearly naked dead-body of their former leader lying on the muddy battle ground.**

Karuna Amman, former LTTE cadre - now a government minister, and Daya Master who recently surrendered to the Sri Lanka security forces have come to Mullativu's final battle ground to identify slain LTTE supremo Velupillai Prabhakarn whose dead body was lying on the muddy ground along side Pudukudirippu - Nandikadal lagoon.

According to the reports, in the morning of 19th May, while the heavy fighting was still going on in the jungle near the lagoon area, where more than 300 Tiger cadres got killed, the soldiers of 53rd battalion led by Major General Kamal Gunaratne, found the dead body of Prabhakaran with gun shot wounds to his head.

According to the defence sources, the LTTE leader Velupillai Prabhakaran, who has ordered thousands of Tamil youth to give up their lives for him, has tried to save his own life until the last moment. His son Charles Anthony had died previous day.




**ඉරිදා SUN** - මේ සැරේ දින පොත ලියන්න මම පටන්ගත්තෙ අළුත් පිටුවකින්. ඒකට හේතුව අද උදේ තලවකැලේ නැන්දම්මා කතාකරපු වෙලේ කියපු දෙයක් මතක්වෙලා. දුවේ දැන් මෙහේ අළුත් ලංකාවක් නැන්දම්මා කිව්වා. හැම තැනම කිරිබත්. සිංහළ අවුරුද්දටවත් කිසිම කිසි කාලෙක මේ රටේ මෙචච්වර කිරිබත් උයලා නෑ.... මෙච්චර රතිඤ්ඤා පත්තු කරලා නෑ..සංතෝසෙ කියලා නිම කරන්න බෑ. සංතෝසෙ වැඩිකමට මට ඇඬෙනවා.. දුවේ.... ඔහේලත් මේ වෙලාවෙ මෙහේ ඉන්න තිබුණා.... ඇහෙනව නේද රබන් ගහන සද්දෙ? අවුරුදු 30 ක් පුරා අඬපු ලංකාව දැන් තමයි හිනාවෙන්නෙ.... නැන්දම්මා කිව්වා. මින් ඉදිරියට ලංකාවෙ සිද්ධවෙන හැම දෙයක්ම අළුත් දෙයක් වෙනවා. වෙසක් මාසෙ භාග්‍යවන්ත මාස යක් කියලා කියනවා. හරියට හරි. අපේ රටට වාසනාව උදාවුණේ මේ 2009 භාග්‍යවන්ත වෙසක් මාසෙ තමයි.

**සඳුදා MON** - කෙනෙකුගෙ මරණේදි සතුටුවෙන එක හොඳ නැහැ කිව්වට ප්‍රබාකරන් කියන කුරිරු ගහලයා, අමු ත්‍රස්තවාදියා මැරුවට කොටි හිතවාදියො ඇරුණම මුළු ලංකාවම සංතෝෂවුණා. යාපනේ, මඩකලපුවෙ, ත්‍රිකුණාමළේ, කොළඹ දෙමළ මිනිස්සු පවා ප්‍රීති ඝෝෂා කළා. මුගේ මරණෙ ලංකාවට විතරක් නෙවෙයි මුළු ලෝකෙටම සෙතක්. මම ප්‍රවෘත්තිවල දැක්කා, වවුනියාවෙ අනාථ කඳවුරක එක දෙමළ ගෑණු කෙනෙක් කැඩිච්ච සිංහලෙන් මෙහෙම කිව්වා...“ හමුදාව එල්ටීටී එක නැති කරපු එක ලොකු දෙයක්... දැන් දෙමළ අම්මලට බය වෙන්න ඕන නැහැ තමන්ගෙ දරුවො ටයිගර්ලා ඇවිත් ඩැහැගෙන යාවිය කියලා...” ඔන්න තියෙන සැනසීම...

**කුජදා TUE** - මතුගම සෝමතුංග බාප්ප තවම පිළිගන්නෙ නැහැ ප්‍රභාකරන් මැරුවය කියලා. එයා කියන්නෙ ප්‍රභා මැරිලා දැන් හුහක් කල්ය කියලයි. මැරුණෙ සුනාමිය කාලෙලු. සුනාමිය ආපු දවසෙ රෑ ප්‍රභාකරන් එක්ක තව කොටි නායකයො ගොඩක් වතුරට ගහගෙන ගිහිං කිය ලයි බාප්ප කියන්නෙ. දැන් මේ අහුවෙලා ඉන්නෙ එයා වගේම හිටපු රැවුල තියන තව මහත කොටියෙක්ලු. මං කිව්වා ප්‍රභාකරන්ගෙ මිනිය හම්බවුණේ මුලතිව් කලපුවේ කියලා. එතකොට බාප්ප කියනවා සුනාමියට ගිය ගමන් මෙච්චරකල් කලපුවෙ වතුරෙ යට තියෙන්න ඇතිලු.

**බුදදා WED** - මෙහේ ලන්ඩන්වලයි, ප්‍රංසෙයි ඉන්න කොටි සපෝටර්ලා කියන්නෙ ප්‍රභාකරන් මැරිලා නැත කියලා. උන් ටයිම්ස් පත්තරේට මෙහෙම කියලා තිබුණා. අපේ නායකයා කිසිම කෙනෙකුට මේ සම්ම ජාතියෙ මරන්න බැරිය, ඔය බෙල්ලෙ බැඳන්ඉන්න සයනයිඩ් කරල කෑවත් එතුමා මැරෙන්නෙ නැත. දැනට එතුමා ඉතා සූක්ෂම විදියට වෙන රටකට පැනලා ගිහින්ය, එහේ ඉඳන් ළඟදිම එතුමා ප්‍රකාශයක් නිකුත් කරාවිය ඊළම් 5වෙනි සටන පටන් ගන්න, අන්න එතකල් අපට කොඩි වන වන, කෑගගහ ඉන්නය කියලා කොටි සංවිධානෙ වැඩ බලන කේ. පී. ඊමේල් එකකින් දැනුම් දීලා තියනවය කියලා.

**ගුරුදා THU** - ලංකාවෙ යූඇන්පී පාක්ෂිකයන්ට පවා තද වෙලා ඉන්නෙ රනිල් ලොක්කා මේ යුද ජයග්‍රහණය කරන වෙලාවෙ රටෙන් පිටවෙලා නෝර්වේ වලට ගිහිං එරික් සොල්හයිම් එක්ක මොනවද සාකච්ඡා කරපු එක ගැන. රනිල් හොරෙන්ම ආපහු ලංකාවට ඇවිත්. මොනවද එහේ කළේ කියලා ඇහුවම කිව්වලු, ප්‍රභාකරන් මැරුණු බව අහලා සොල්හයිම් අඬන්න වැළපෙන්න පටන් ගන්න බව දන්න නිසා මූන්ට ටිකක් හිත සැනසෙන්න කතා කරන් නයි ගියේ කියලා. ඇත්ත තමයි, දුකකදි යාළුවො ළඟ ඉන්න එක කොච්චර දෙයක්ද? රනිලුත් අඬන්න ඇති.

**කිවිදා FRI** - ප්‍රභාකරන්ගෙ මිනිය අඳුරගන්න අපේ හමුදාව මුලතිව් යුදබිමට දැන් ඇමති කෙනෙක් වෙලා ඉන්න කරුණායි, ළඟදි හමුදාවට බාරවෙච්ච දයා මාස්ටර් කියන පරණ කොටි සාමාජිකයයි අඬගහගෙන ආවා. ඒ දෙන්නා මහ කොටියගෙ මළකඳ දිහා බලලා එවලෙම කිව්වා, මේ තමයි ප්‍රභාකරන්...අපි හොඳාකාරවම දන්නවා මේ එයයා කියලා.... එහෙම කියපු ඒ දෙන්නා මිනිය දිහා හුහක් වෙලා බලාගෙන හිටියා. ඒ බලන් හිටි විදියෙන් කියන්න ඇහැකි, ඒදෙන්නම මෙහෙම හිතන්න ඇති කියලා. මගෙ අම්මෝ අපි බේරිච්ච බේරිල්ල....හොඳ වෙලාවට ආණ්ඩුව පැත්තට පැනගත්තෙ. නැත්නම් ආඩවනේ හමුදාවෙන් වෙඩිකාලා අපිත් මෙහෙම උඩුබැලි අතට දපල ඉන්නවා. ඉස්සර කරපු පුංචි පිනක් අපි ගාව තියෙන්න ඇති.

**ශනිදා SAT** - අච්චර විසාල යුද්ධයක් දිනුවට බටහිර ලෝකෙ එකෙක් ලංකාව වෙනුවෙන් අප්පුඩියක් ගැහුවෙ නැහැ. අපි හිතුවෙ ලෝකෙ දරුණුම ත්‍රස්තවාදෙ පරාජය කළාම මුළු ලෝකෙම එකාවගේ සංතෝෂවෙලා අපිව බදාගෙන ඉඹීවි කියලා. ඒ වෙනුවට මේ බටහිර වලත්ත රටවල් හදන්නෙ ලංකා රජය යුද අධිකරණයට ගෙනියන්න. ශ්‍රී ලංකා හමුදාව ලක්ෂ ගණනක් දෙමළ වැසියො බේරගත් තයි කිව්වට මූන් පිළිගන්නෙම නැහැ. මූන්ගෙ තියෙන්නෙ විසාල ඉරිසියාවක්. කවදාවත් දිනන්න බැහැයි කියපු යුද්ධෙ අපි දිනුව නිසා. මේ යුද්ධෙන් අපි අඳුරගත්තා ලෝකෙ ඉන්න අපේ යාළුවො කවුද කියලා. ඒ එක්කම දෙමළ ජාතියෙ සැබෑ ස්වරූපයත් අපි අඳුරගත්තා.